# බළන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| **ස්ථානය** | : | බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව |
| **දිනය** | : | 2013.04.30 |
| **වේලාව** | : | පෙ.ව. 10.00 |

බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වයː**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

- ගරු උප සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් පෞද්ගලික කටයුත්තක් සඳහා විදේශගත වීම හේතුවෙන් මෙදින මහා සභා රැස්වීමට සහභාගී නොවීය.

**නිලධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එම්. එච්. සීලවතී මිය |

## 01 ආගම සිහි කිරීමː

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මහා සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව වෙනත් අදහස් දැක්වීම් නොවූ බැවින් එය කියවූ ලෙස සලකා මහා සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

## 03. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

ගරු සභාපතිතුමා සභාව අමතමින් මේ පවත්වන්නට යෙදෙන්නේ 2013 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාල මහා සභා රැස්වීම බව දැනුම් දෙන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් සභාව අමතමින්, මෙම සභා වාරයට පැමිණි ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය හා පුවත්පත් කලාවේදී මහත්ම මහත්මීන් ඇතුළු සියළු දෙන ඉතා ගෞරවයෙන් පිළිගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සමාලෝචනය සිදු කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 වරිපනම් අඩු කර ගැනීම - අංක 123 - නිශාන්ත ලියනගේ මයා

බලන්ගොඩ, පරණ පාර, අංක 123/ඒ දරන උත්සව ශාලාව සඳහා තක්සේරු ප්‍රතිශෝධනය හේතුවෙන් පෙර රු. 160,480.00ක් වශයෙන් තිබූ වාර්ෂික වටිනාකම රු. 914,286.00 දක්වා වැඩි වී ඇති බැවින් ගෙවිය යුතු වරිපනම් මුදල විශාල ප්‍රමාණයකින් වැඩි වී ඇති බව ද, එබැවින්, එම ආයතනයට වරිපනම් සහනයක් ලබා දෙන මෙන්ද ඉල්ලා ඇති බව දැන්වූ ගරු සභාපතිතුමන්, එම ආයතනයට 25%ක වරිපනම් සහනයක් ලබා දීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

### 06:02 තක්සේරු කරන ලද බදු මුදල් ඉවත් කර ගැනීම - අංක 99 - එම්. අමරසේන මයා

වරිපනම් අංක 99, දරන ස්ථානයේ පවත්වාගෙන යනු ලබන වෙළඳ සැල වසා ඇති බැවින් ඒ සඳහා වරිපනම් සහනයක් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, එම ඉල්ලීමෙන් අනතුරුව නැවත එම ස්ථානයේ වෙනත් ව්‍යාපාරයක් ආරම්භ කර ඇති බව වාර්තා වී ඇති බැවින් ඉල්ලා ඇති වරිපනම් සහනය ලබා නොදීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

### 06:03 නගර සභාව සතු ඉඩම් කැබැල්ල ලබා ගැනීම - ඒ. ඒ. සෝමපාල මයා

මෙම සභාවට අයත්, ඕළුගංතොට, අංක 429 දරන ඉඩම බදු ගිවිසුමක් මත ලබා දෙන මෙන් ඉල්ලීමක් කර ඇති බව ගරු සභාපතිතුමන් දැනුම් දුන් අතර, සංවර්ධන කටයුත්තක් සඳහා නැවත අත්කර ගැනීමේ කොන්දේසිය මත, මසකට රු. 150.00 බැගින් අයකර බදු පදනම මත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 06:04 බස් නැවතුම්පොල වෙළඳ සංකීර්ණය බී - 01 කඩ කාමරය පවරා දීම - සිත්තරවේල් තුෂාන්දන් මයා

බස් නැවතුම්පොල බී - 01 කඩ කාමරය හිමිව සිටි සෙල්ලප්පන් සිත්තරවේලු යන අය මිය ගිය බැවින් එම කඩ කාමරය ඔහුගේ එකම පුත්‍රයා වන සිත්තරවේල් තුෂාන්දන් යන අය වෙත පවරා දෙන ලෙස ඔහුගේ පුත්‍රයා ඉල්ලා ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමන්, මේ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම සඳහා මිය ගිය අයගේ බිරිඳ සමඟ කාර්යාලයට පැමිණෙන ලෙස දැන්වීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:05 ඒ - 10 කඩකාමරය ලබා ගැනීම - එම්. වී. ශාන්ත කුමාර මයා**

බලන්ගොඩ, බස්නැවතුම්පොල ඒ-10 කඩ කාමරය එය දැනට පවත්වාගෙන යනු ලබන එම්. ආර්. එම්. ෂෆාන් යන අය විසින් තමන් හට පැවරීමට කැමැත්ත පල කර ඇති බැවින් එය ලබා දෙන මෙන් ඉල්ලා එම්. වයි. ශාන්ත කුමාර යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමන්, සභාවට ලැබිය යුතු 25%ක මුදල එකවර අයකර ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනස් අදහස් ඉදිරිපත් නොවූ බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**06:06 අභියාචනාධිකරණ නඩු අංක CA/PHC/176/2006**

අංක CA/PHC/176/2006 දරන නීති කෘත්‍යයට 2013.05.07 වන දින අභියාචනාධිකරණයේ පෙනී සිටීමට දන්වා එම අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් යොමු කර ඇති ලිපිය මහා සභාවේ දැන ගැනීම පිණිස ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී.

**06:07 City Resilient Profiling වැඩසටහනේ නියෝජිත සමුළුව මැයි මස 19 සිට 24 දක්වා - ස්විට්සර්ලන්තය**

City Resilient Profiling වැඩසටහන යටතේ ලෝකයේ නගර 10ක් තෝරාගෙන සංවර්ධනය කිරීමේ වැඩසටහනක් සඳහා තෝරාගෙන ඇති බව ද, ඒ සඳහා මෙම නගර සභාව ද සුදුසුකම් ලබා ඇති බව ද සඳහන් කළ ගරු සභාපතිතුමන්, 2013.05.19 වන දින සිට 2013.05.24 දින දක්වා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර දී පැවැත්වෙන එම සමුළුවට තමන්ට සහ සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිලක මහතාට සහභාගී වීමට දන්වා ඇති බව ද සඳහන් කළ අතර, විදේශ චාරිකාව සඳහා සහභාගී වීම සඳහා නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, විරුද්ධ අදහස් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 කසළ බහාලීමේ මළු හඳුන්වා දීම - සෞඛ්‍ය අංශය**

2013.07.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දිරන කසළ එකතු කිරීම සඳහා වර්ග තුනකින් කසළ බහාලන මළු හඳුන්වා දීමට ද, මෙම බෑග් ව්‍යාපාරිකයන් හරහා අලෙවි කිරීමට ද අදහස් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. එම මල්ලක ප්‍රමාණය අනුව විකුණන මිල සහ මල්ලක් අලෙවියෙන් වෙළඳ නියෝජිතයා වෙත ලැබෙන කොමිස් මුදල ද පහත පරිදි දක්වා ඒ සඳහා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

| | මල්ලක ප්‍රමාණය | ඒකක මිල | වෙළඳ නියෝජිතයා වෙත ලැබෙන කොමිස් මුදල |
|---|---|---|---|
| 1. | 2 kg | රු. 05.00 | රු. 00.25 |
| 2. | 5 kg | රු. 10.00 | රු. 00.50 |
| 3. | 10 kg | රු. 20.00 | රු. 01.00 |

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2013**

මග නැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2013 යටතේ ඉදිරිපත් වී ඇති යෝජනා වලට අනුව උපදෙස් ලබා දී ලබා දී ඇති පරිදි ක්‍රියාත්මක කළ නොහැකි වැඩටසටහන් ලෙස කාර්මික නිලධාරී විසින් දක්වා ඇති වැඩ ලැයිස්තවක් ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව පහත සඳහන් කර්මාන්ත සඳහා කාර්මික නිලධාරී වෙතින් ඇස්තමේන්තු සකස් කරවා එම ව්‍යාපෘතිය යටතේ ඉටු කිරීම සඳහා කටයුතු කිරීමට යොජනා කරන ලදී.

- වීරසුන්දරාරාම ප්‍රවේශ මාර්ගය 1 අදියර - PCC/24/13/73
- ශෛලතලාරාම ප්‍රවේශ මාර්ගය 1 අදියර - PCC/24/13/76
- බළන්ගොඩ පොලිස් ක්‍රීඩා පිටිය ප්‍රවේශ මාර්ගය 1 අදියර - PCC/24/13/104
- බළන්ගොඩ සෞ.වෛ.නි. කාර්යාල ප්‍රවේශ මාර්ගය 1 අදියර - PCC/24/13/105
- කිරිඳිගල ශෛලතලාරාම ප්‍රවේශ මාර්ගය 2 අදියර - PCC/24/13/106
- සුනන්දාරාම ප්‍රවේශ මාර්ගය 1 අදියර - PCC/24/13/108

වීරසුන්දරාරාම II අදියර කර්මාන්තය ඉටු කිරීමේ දී ඉතිරි වන ගල් බෝධි මළුව වටා ඇතිරීමටත් පොලිස් ක්‍රීඩාපිටිය ප්‍රවේශ මාර්ගයේ ඉතිරි වන ගල් වොලිබෝල් ක්‍රීඩා පිටිය වටා ඇතිරීමටත් එතුමන් විසින් යෝජනා කරන ලදී.

මෙම යෝජනාව නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බස් ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලීම**

2013.04.13, 14, 15 හා 16 යන දිනයන්හි බස් ධාවනය ඉතා අඩු බව ද, එබැවින් සේවයෙන් බැහැරව සිටි බව ද, දන්වා බස්නැවතුම්පොල පෞද්ගලික බස් බදු අයකරු විසින් දන්වා ඇති බව සඳහන් කළ ගරු සභාපතිතුමන්, බස් රථ ධාවනය අඩු වන්නේ අප්‍රේල් මස 14 සහ 15 යන දෙදින පමණක් බැවින් එම දින දෙක සඳහා පමණක් ගාස්තු අය කිරීමෙන් නිදහස් කිරීමට යෝජනා කළේය.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 ස්පාඤ්ඤයේ විගෝ විශ්ව විද්‍යාලයේ දේශනයකට සහභාගී වීම - මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. එන්. ප්‍රේමතිකල මහතා**

ස්පාඤ්ඤයේ විගො විශ්ව විද්‍යාලයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දේශනයක් සඳහා මෙම නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක එම්. ඒ. නිමල් ප්‍රේමතිලක මහතා වෙත ආරාධනාවක් ලැබී ඇති බව ගරු සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, අදාල වැඩමුළුව 2013.06.24 වන දින සිට 2013.06.29 වන දින දක්වා පැවැත්වෙන බව ද, අදාල විශ්ව විද්‍යාලයෙන් මූල්‍ය අනුග්‍රහය ලැබෙන බව ද වැඩිදුරටත් සඳහන් කළ ගරු සභාපතිතුමන් එම සංචාරයට සහභාගී වීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා වෙත නිවාඩු අනුමත කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් යෝජනා ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06.12 ත්‍රී රෝද රථයේ අලුත්වැඩියා කටයුතු**

මෙම සභාවට අයත් SG QL 2901 දරන ත්‍රී රෝද රථය අලුත්වැඩියා කටයුතු සිදු කිරීම කළ යුතු බව ත්‍රීරෝද රථ ධාවක ඩී. එම්. කෝසල තිළිණ අංජු මහතා විසින් දන්වා ඇති බව

දැන්වූ ගරු සභාපතිතුමන් අදාල අලුත්වැඩියා කටුයුතු සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:11 අංක 11 කඩ කාමරය ආපසු භාර දීම**

බස් නැවතුම්පොල අංක 11 දරන වෙළඳසැල ආපසු භාර දෙන බව දන්වා ප්‍රියන්ත ලාල් මුතුමාල යන අය විසින් දන්වා එවා ඇති බව ගරු සභාපතිතුමන් විසින් දන්වන ලද අතර, එම කඩකාමරය භාර ගෙන පුවත්පත් දැන්වීමකින් තොරව ටෙන්ඩර් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

| 2013.03.20 සිට 2013.04.17 දක්වා රු. 10,000ට වැඩි ගෙවීම් - පොදු ගිණුම | | | | |
|---|---|---|---|---|
| දිනය | විස්තරය | වව්චර අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
| 2013.03.20 | ටී. ඒ. ටී. එච්. තෙබුවන<br>කෘෂ කැබ් රථය අළුත්වැඩියාව | 68 | 427783 | 11,500.00 |
| | ටී. ඒ. ටී. එච්. තෙබුවන<br>ජේ. සී. බී. යන්ත්‍රය අළුත්වැඩියාව | 71 | 427783 | 12,850.00 |
| | ටී. ඒ. ටී. එච්. තෙබුවන<br>ජේ. සී. බී. යන්ත්‍රය අළුත්වැඩියාව | 72 | 427783 | 22,800.00 |
| | ටී. ඒ. ටී. එච්. තෙබුවන<br>ගලි බවුසරය අළුත්වැඩියාව | 73 | 427783 | 13,650.00 |
| | මෙට්‍රොපොලිටන් ඔෆිස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම | 74 | 427784 | 20,160.00 |
| | සාමාන්‍යාධිකාරී ඉඹුල්පෙ වි.සේ.ස සමිතිය<br>2013.01.07 සිට 2013.01.30 දක්වා ඉන්ධන බිල්පත පියවීම | 75 | 427785 | 97,578.50 |
| | බී ගුණරත්න<br>2013.03.01 සිට 2013.03.15 දක්වා නගරයේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය | 78 | 427787 | 117,500.00 |
| | සභාපති, අලුත්ගෙදර ග්‍රාමසංවර්ධන සමිතිය<br>නාගරික ළමා උද්‍යානය ඉදිකිරීම කර්මාන්තයේ රැඳවුම් ඇප තැන්පත් ආපසු ගෙවීම | 80 | 427789 | 127,083.28 |
| | ළහිරු ඇඩ්වටයිසින්<br>දොරවෙල ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ස්ටිකර් බෝඩ් එකක් සහ නව පුවරුව විවෘත කිරිමේ තිරය සැකසීම | 82 | 427819 | 149,500.00 |
| | රිෂානා සර්විස් ස්ටේෂන්<br>ටිපර් රථය පූර්ණ සේවා කිරීම | 89 | 427821 | 14,340.00 |

| | | | | |
|---|---|---|---|---|
| | රිෂානා සර්විස් ස්ටේෂන්<br>RC 8183 ට්‍රැක්ටරය පූර්ණ සේවා කිරීම | 91 | 427821 | 16,512.00 |
| | එච්. එෆ්. එස්. ජේ. ෆොන්සේකා<br>කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය තැබීමට මේසයක් හා ටෙන්ඩර් පෙට්ටියක් සැකසීම | 93 | 427822 | 34,500.00 |
| | එල්. ඊ. සී. සී. මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා ගල් සැපයීම | 94 | 427824 | 21,800.00 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2012 දෙසැම්බර් මාසය පළාත් පාලන විශ්‍රාම වැටුප් බිල්පත් | 98 | 427828 | 18,194.5 |
| | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක<br>2013 ජනවාරි විශ්‍රාම වැටුප් බිල්පත් | 99 | 427828 | 18,194.53 |
| | එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම<br>පොදු වෙළඳසැල අංක 12 කඩ කාමරය ටෙන්ඩර් කිරීම සඳහා 2013/02/09 පළකළ පුවත්පත් දැන්වීම | 101 | 424829 | 24,192.00 |
| 2013.04.01 | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බලන්ගොඩ මහජන පොළේ අතිරේක මඩු 40 ඉදි කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 1 | 427840 | 850,000.00 |
| 2013.04.02 | බී. ගුණරත්න<br>2013.03.16 සිට 2013.03.21 දක්වා නගරයේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය | 2 | 427841 | 117,500.00 |
| 2013.04.05 | සභාපති, කරදියමුල්ල ග්‍රාම සංවර්ධන සමිතිය<br>කොට බෝධිය අසළ මාර්ගය II අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම අවසන් කිරීම | 4 | 427843 | 414,613.23 |
| | සභාපති, සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය<br>කිරිඳිගල දේවස්ථානයේ සුසාන භූමියට යන මාර්ගය අන්තර් සම්බන්ධිත කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 5 | 427844 | 625,842.87 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>තුඹගොඩ දෙගලහතැන්න මංජු මහතාගේ නිවස අසළ මාර්ගය I අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම | 6 | 427845 | 393,457.15 |
| | ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2013/02/11 සිට 2013/02/28 දක්වා ඉන්ධන බිල්පත | 7 | 427846 | 114,641.75 |
| | ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2013.02.01 සිට 2013.02.20 දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 8 | 427846 | 79,019.40 |
| | ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2013.02.07 සිට 2013.02.23 දක්වා නගරයේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය | 9 | 427848 | 24,000.00 |
| | එම්. ජී. පියසේන<br>2013.03.04 සිට 2013.04.01 දක්වා පෞද්ගලික බස් රථ ගාල් කොමිස් මුදල් ආපසු ගෙවීම | 11 | 427850 | 165,750.00 |

| | | | | |
|---|---|---|---|---|
| | සේනක සිමෙන්ති ප්‍රොඩක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>බෝම්බුව බෝධිමණ්ඩලාරාම මාවත II අදියර අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 13 | 427850 | 165,750.00 |
| | ඩබ්. ඒ. එන්. සී. හාඩ්වෙයාර්<br>2013 අයවැය යටතේ මුස්ලිම් පල්ලි වලට ලබා දීමට ටකරන් මඩු 02ක් ලබා ගැනීම | 14 | 427851 | 150,000.00 |
| 2013.04.10 | කේ. ඩබ්. සිරිපාල<br>තානායමට ලී බඩු ලබා ගැනීම | 16 | 427863 | 170,000.00 |
| | ජී. ඩබ්. ඉන්ද්‍රලාල්<br>වැලි සැපයීම | 17 | 427864 | 20,700.00 |
| | හර්ෂන කලර් සෙන්ටර් - ක්‍රීඩාංගනයේ තීන්ත ආලේපයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 18 | 427865 | 61,714.50 |
| | හර්ෂන කලර් සෙන්ටර්<br>ක්‍රීඩාගාරයේ තීන්ත ආලේපයට අවශ්‍ය ද්‍රව්‍ය | 19 | 427865 | 22,046.40 |
| | සිටි ඉලෙක්ට්‍රිකල්ස්<br>වීථි පහන් නඩත්තුවට හා කාර්යාලය ඇතුලත අලුත්වැඩියාවන් සඳහා විදුලි උපාංග ලබා ගැනීම | 20 | 422866 | 134,915.00 |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>නාගරික මන්ත්‍රීවරුන්ගේ දුරකථන බිල්පත් පියවීම | 22 | 427868 | 10,743.01 |
| | ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2013.02.28 සිට 2013.03.06 වන දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 32 | 422871 | 100,385.60 |
| | ඉඹුල්පෙ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2013.03.06 සිට 2013.03.12 වන දින දක්වා ඉන්ධන බිල්පත් පියවීම | 33 | 422871 | 80,768.20 |
| | ජාන් කොම්පියුටර්ස් සර්විසස්<br>කාර්යාලය සඳහා පරිගණක උපාංග හා ටෝනර් ලබා ගැනීම | 35 | 422873 | 39,000.00 |
| | සභාපති, තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>උඩකන්ද අතුරු මාර්ගය I අදියර කොන්ක්‍රීට් කුට්ටි දමා ඇතිරීම අවසන් කිරීම | 36 | 427874 | 420,200.00 |
| | තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>මුගුණමලේ ජස්ටින් ෆොන්සේකා මහතාගේ නිවස දක්වා දිවෙන මාර්ගය I අදියර කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම | 37 | 427874 | 425,500.00 |
| 2013.04.12 | කේ. ඩී. නිශාන්ත<br>කාර්යාලයේ දුරකථන පද්ධතිය සකස් කිරීම | 40 | 427877 | 17,550.00 |
| | ජෝති ස්ටෝර්ස්<br>කර්මාන්ත අංශයේ හා සෞඛ්‍ය අංශයේ කම්කරුවන්ට උපකරණ ලබා දීම | 46 | 427883 | 18,055.00 |
| | කැළණි ඒජන්සීස්<br>තණකොළ කපන යන්ත්‍රයට අමතර කොටස් ලබා ගැනීම | 47 | 427884 | 16,850.00 |

| | | | | |
|---|---|---|---|---|
| | රිෂානා මෝටර්ස් ඇන්ඩ් ඉංජිනියරිං<br>ත්‍රී රෝද රථයට අමතර කොටස් ලබා ගැනීම | 49 | 427885 | 10,951.00 |
| | රිෂානා මෝටර්ස් ඇන්ඩ් ඉංජිනියරිං<br>ත්‍රී රෝද රථයට අමතර කොටස් ලබා ගැනීම | 50 | 427885 | 12,141.00 |
| | නිව් වෙල්කම් එන්ටර්ප්‍රයිසස්<br>ශබ්ද විකාශන යන්ත්‍රයට අමතර කොටස් ලබා දීම | 51 | 427886 | 24,000.00 |
| | පුබුදු පොත් හල<br>පෙර පාසැල සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 52 | 427887 | 39,100.00 |
| | ඇල්ෆා ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්<br>කාර්යාලය සඳහා වානේ අල්මාරියක් ලබා ගැනීම | 53 | 427888 | 14,336.00 |
| | බී. ගුණරත්න<br>2013.04.01 සිට 2013.04.15 දක්වා නගරයේ කසළ එකතු කිරීම හා ප්‍රවාහනය | 55 | 427890 | 117,500.00 |

**2013.03.20 සිට 2013.04.19 වන දින දක්වා රු. 10,000.00 වැඩි ගෙවීම් තානායම් ගිණුම්**

| දිනය | විස්තරය | වව්චර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2013.03.20 | ලයන් බෲවරි ලිමිටඩ්<br>රට බීම ලබා ගැනීම | 31 | 280190 | 21,575.78 |
| | ප්‍රියන්ත මුතුමාල<br>මාළු ලබා ගැනීම | 33 | 280191 | 51,662.00 |
| | එන්. අයි. ටී. ෆාම් ෂොප්<br>කුකුල් මස් ලබා ගැනීම | 34 | 280192 | 34,875.00 |
| | එන්. අයි. ටී. ෆාම් ෂොප්<br>කුකුල් මස් ලබා ගැනීම | 35 | 280192 | 31,800.00 |
| 2013.03.22 | ජගත් එන්ටප්‍රයිසස්<br>ගෑස් ලබා ගැනීම | 36 | 380195 | 12,115.00 |
| 2013.03.27 | රෝක්ලන්ඩ් ඩිස්ටිලරීස් කම්පැනි<br>රටබීම ලබා ගැනීම | 39 | 380198 | 49,641.57 |
| | සෙනාල් මාර්කටින්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 40 | 280199 | 53,290.00 |
| | අයි. ඩී. ලංකා ලිමිටඩ්<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 42 | 280301 | 56,058.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 44<br>47 | 280302<br>280302 | 27,500.00<br>18,489.00 |
| | විනෝරා ඩිස්ට්‍රිබියුටර්ස්<br>බීම වර්ග ලබා ගැනීම | 49 | 280303 | 10134.00 |
| | ශ්‍රී ලංකා ට්‍රේඩිං කොම්පැනි<br>තානායම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම | 52 | 256306 | 27,089.93 |
| | ලංකා විදුලිබල මණ්ඩලය<br>2013 මාර්තු මස විදුලි බිල්පත | 56 | 256309 | 40,123.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2013.04.08 | ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා පී. එල්. සී<br>රටබීම ලබා ගැනීම | 4 | 356314 | 187,277.52 |
| 2013.04.10 | යූ. එන්. මාර්කටින්<br>රටබීම ලබා ගැනීම | 6 | 356316 | 13,561.92 |
| | එන්. අයි. ටී. ෆාම් ෂොප්<br>කුකුල් මස් ලබා ගැනීම | 12<br>13<br>14 | 356322<br>356322<br>316322 | 28,800.00<br>35,100.003<br>5,100.00 |
| | ඉන්දික එරික් සිසිල්<br>එළවලු ලබා ගැනීම | 22<br>23 | 356,325<br>356325 | 11,115.00<br>14,735.00 |
| | ශ්‍රී ස්ටෝර්ස්<br>මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 25<br>26<br>37<br>30<br>31 | 356331<br>356331<br>356331<br>356331<br>356331 | 39,287.00<br>23,909.00<br>19,295.00<br>21,955.00<br>11,203.00 |

**2013.03.11 සිට 2013.04.10 දක්වා රු. 10,000.00 වැඩි ගෙවීම් - ලංකා බැංකු ගිණුම**

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2013.03.11 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2013 ජනවාරි මාසය<br>බස් නැවතුම්පොල - රු. 94,079.50<br>පොදු වෙළඳසැල - රු. 14,660.80<br>මහජන පොල - රු. 24,607.50<br>**- රු. 133,347.80** | 1 | 000247 | 133,347.80 |
| 2013.03.15 | ලංකා විදුලිබල මණ්ඩලය<br>2013 පෙබරවාරි විදුලි බිල්පත - නව බස් නැවතුම්පොල | 2 | 000248 | 70,425.00 |
| | ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය<br>2013 පෙබරවාරි ජල බිල්පත<br>බස් නැවතුම්පොල - රු. 69,999.50<br>පොදු වෙළඳසැල - රු. 16,172.80<br>මහජන පොල - රු. 21,331.50 | 3 | 000249 | 107,503.80 |
| 2013.04.10 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>2013 මාර්තු මාසය<br>බස් නැවතුම්පොල - රු. 89,235.50<br>පොදු වෙළඳසැල - රු. 12,896.80<br>මහජන පොල - රු. 24,187.50<br>පින්තාලිය - රු. 892.64 | 4 | 000250 | 127,212.44 |
| | ලංකා විදුලිබල මණ්ඩලය<br>2013 මාර්තු මස විදුලි බිල්පත - බස් නැවතුම්පොල | 5 | 000251 | 6,133,250.00 |

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

### 08:01 මල අපද්‍රව්‍ය ප්‍රතිකාරක පද්ධතියේ ජලය පිරිසිදු කිරීමේ ක්‍රමය වැඩිදියුණු කිරීම

ගරු සභාපතිතුමන් විසින් බැංකියවත්ත අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ මල අපද්‍රව්‍ය ප්‍රතිකාරක පද්ධතියේ ජලය පිරිසිදු කිරීමේ ඒකකයක් ඉදිකිරීම සඳහා වන රු. 659,058.44ක මූල්‍ය ඇස්තමේන්තුව මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, ප්‍රතිපාදන ලැබෙන පරිදි ඉටු කිරීමට මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

### 08:02 බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය - අත්‍යවශ්‍ය අළුත්වැඩියා ඇස්තමේන්තු

1. බැංකියවත්ත ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණ ඒකකයේ වඩිම්බු, ජල බස්නා නල, වැහිපිහිලි, කාණුව යෙදීම සහ පැතිබැම්ම ඉදිකිරීම කර්මාන්තය සඳහා වන රු. 644,341.56ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

2. බැංකියවත්ත දේශන ශාලාව හා සම්බන්ධ කොටසින් රසායනාගාරයක් සඳහා කොටසක් වෙන් කර ගැනීම කර්මාන්තයට අදාල රු. 68,125.87ක වියදම් ඇස්තමේන්තුවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

3. බැංකියවත්ත කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කම්කරුවන් හට ආහාර ගැනීම සඳහා කොටසක් වෙන් කර ගැනීම කර්මාන්තය සඳහා වන රු. 220,229.46ක ඇස්තමේන්තුවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ප්‍රතිපාදන ලැබෙන පරිදි සිදු කිරීමට මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:03 පුරණගෙදර මාර්ගයේ කාණු පද්ධතියේ කොටසක් කොන්ක්‍රීට් කිරීම

පුරණගෙදර මාර්ගයේ කාණු පද්ධතියේ කොටසක් කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයට අදාල රු. 150,445.82ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:04 වැලිහරණාව උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය පඩි යොදා සැකසීම කර්මාන්තය

වැලිහරණාව උපුල් මහතාගේ නිවස දක්වා මාර්ගය පඩි යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා වන රු. 101,002.28ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 08:05 ප්‍රතිපාදන වෙන් කිරීම - හුණුකුඹුර මාර්ගය ගල් අතුරා තාර යොදා සංවර්ධනය කිරීම

හුණුකුඹුර මාර්ගය ගල් අතුරා, තාර යොදා සංවර්ධනය කිරීම කර්මාන්තයට අදාල රු. 771,307.87 ක වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීමටත් ප්‍රදේශයේ ක්‍රියාකාරී සමාජ සංවිධානයක් වන තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය හරහා එය ඉටු කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී. වෙනත් යෝජනා ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**08:06 කළුඇල්ල කැලේ 1 පටුමග පැතිබැම්ම යොදා සංවර්ධනය කිරීම**

කලුඇල්ල කැලේ මාර්ගයේ I පටුමග පැතිබැම් යොදා සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා වන රු. 86,431.95ක වියදම් ඇස්තමේන්තුව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට හා ප්‍රදේශයේ ක්‍රියාකාරී ප්‍රජා සංවිධානයක් වන කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙතින් එම කර්මාන්තය සිදු කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

ලංසු මිල ගණන් මහා සභාවට ඉදිරිපත් කර නොතිබුණි.

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

**11:01 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද පහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රීතුමන් වෙත වෙන් කරන ලද 2013 අයවැය ප්‍රතිපාදන මුදලින් ක්‍රියාත්මක කිරීමට මහා සභාවේ අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා යෝජනා කරන ලදී.

1. කුමාරගම පුපුලවත්ත මාර්ගය සරත් මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා දීම - රු. 60,000.00
2. දෙහිගස්තලාව දාරුල් හික්මා පෙර පාසැලට උපකරණ ලබා දීම. රු .40,000.00
3. දෙහිගස්තලාව කුමාරගම පල්ලියට පුටු ලබා දීම. රු. 50,000.00

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 2013 මාර්තු ලැබීම් විග්‍රහය**

- 2013 මාර්තු මාසය සඳහා වන ලැබීම් විග්‍රහය සභාවේ අනුමත **විය.**

| | |
|---|---:|
| පුනරාවර්තන ලැබීම් | 11,293,556.76 |
| වෙනත් ලැබීම් | 6,329,706.86 |
| **මුළු ලැබීම්** | **17,623,263.62** |
| පුනරාවර්තන වියදම් | 5,559,611.00 |
| වෙනත් වියදම් | 6,468,419.02 |
| **මුළු වියදම්** | **12,028,030.02** |

- බලන්ගොඩ තානායමේ 2013.03.01 සිට 2013.03.31 වන දින දක්වා වෙළඳ හා ලාභ අලාභ ගිණුම සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමී මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.02.01 සිට 2013:02.28 වන දින දක්වා සහ 2013.03.01 සිට 2013.03.26 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන්**

2013.02.01 සිට 2013:02.28 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 307,802.95කි.

2013.03.01 සිට 2013:03.31 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 404,405.60කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවන්ට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

2013 අප්‍රේල් මාසය සඳහා කාරක සභා වාර්තාවන් ඉදිරිපත් කර නොතිබුනි.

## 16. වෙනත් කරුණු:

**16:01 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා:**

ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා සභාව අමතමින්, බලන්ගොඩ නගරයේ හෝරාස්ථම්භයේ වෙලාව වැරදියට සටහන්වන බවත්, එය නිවැරදි කිරීම කළ යුතු බවත් සඳහන් කළේය. පළාත් සභා ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමන් විසින් නගරයේ විදුලි පහන් සවි කිරීම සඳහා වෙන් කරන ලද රු. 200,000.00ක මුදලින් ප්‍රධාන වීදියේ විදුලි පහන් සවි කිරීමටත්, සේනක පෙදෙසේ විදුලි පහන් සවි කිරීමටත් යෝජනා කරන බව ද සඳහන් කළේය.

**16:02 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාව අමතමින් බලන්ගොඩ නගරයේ විදුලි පහන් සවි කිරීමේ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දිම වෙනුවෙන් පළාත් සභා ගරු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමන් වෙත ස්තුතිය පළ කරන බව සඳහන් කළේය. එමෙන්ම සබරගමුව පළාත් මාර්ග සංවර්ධන ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් විසින් ද ප්‍රදේශයේ මාර්ග සංවර්ධනයට රුපියල් එක් කෝටි හත් ලක්ෂයක මුදලක් වෙන් කරන ලද බව ද, පසුගිය වර්ෂයේ දී තමන් විසින් කරන ලද යෝජනාවකට අනුව ඒ සඳහා රු. 3,500,000.00ක මුදලක් වෙන් කරන ලද බව ද, මෙවර ද රු. 1,000,000.00ක මුදලක් වෙන් කිරීම සම්බන්ධව එතුමන්ට ස්තුතිවන්ත වන බව ද සඳහන් කළේය. එමෙන්ම වරාය හා මහා මාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමන් විසින් ද මාර්ග සංවර්ධනය පිණිස සිදු කරනු ලබන සේවයට ස්තුතිය පළ කරන බව වැඩිදුරටත් සඳහන් කළේය.

**16:03 ගරු නාගරික චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් සභාව අමතමින්, රජය විසින් ඉහල දමා ඇති විදුලි ගාස්තුව සාධාරණ මිල සූත්‍රයකට අනුව සංශෝධනය කළ යුතු බව ප්‍රකාශ කළේය. එමෙන්ම බළන්ගොඩ මහජන පොල ඉඩමට අදාල නඩුවේ නීතිඥ ගාස්තු වශයෙන් රු. 40,000.00ක් ඉල්ලා ඇති බැවින්, අදාල නඩුව සම්බන්දව සහ එම ඉඩම සම්බන්ධව සභාව දැනුවත් කිරීම කළ යුතු බවත් සඳහන් කළේය. එමෙන්ම, බළන්ගොඩ නගර සභාවට අයත් ඉඩම් 'අතයට' ගණුදෙනු වලට යන ක්‍රමයක් තිබෙන බව ද, ඒවා ඔප්පු කර පෙන්වීම කළ හැකි බව ද, මෙම ගණුදෙනු විනිවිද භාවයකින් යුතුව සිදු කළ යුතු බව ද වැඩි දුරටත් සඳහන් කළේය. විශේෂයෙන් බස් නැවතුම්පොල සී-52 කඩකාමරයට අදාල මූල්‍ය ගණුදෙනු සම්බන්ධව විනිවිද භාවයකින් යුතු වීම අත්‍යවශ්‍ය බව ද සඳහන් කළේය.

තව දුරටත් අදහස් දක්කමින් එතුමන් සඳහන් කළේ හෘද සාක්ෂියට එකගව නගරයේ සම්පත් ආරක්ෂා කළ යුතු බවත්, මෙසේ පෙන්වා දීම් කර තිබිය දීත් තව දුරටත් එම කටයුතු පෙර ආකාරයෙන්ම සිදුවනවා නම් මෙම ගරු සභාවෙන් ඉල්ලා අස්වීමට තීරණයක් ගැනීමට සිදුවන බවත්ය. එමෙන්ම මාසික කුලී පදනම යටතේ ලබා දී ඇති කඩ කාමර සඳහා දීර්ඝ කාලීන බදු ලබා දීමට විරෝධය පළ කරන බව සඳහන් කළේය.

*එම අදහස් දැක්වීමට පිළිතුරු ලබා දෙමින් **ගරු සභාපතිතුමන්** ප්‍රකාශ කළේ, මහජන පොල ඉඩමට අදාල නඩුවට පාදක වන්නේ බළන්ගොඩ ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරයේ කොටසක සිට දැනට පොල ඉදිකර ඇති ස්ථානය දක්වා ඇති, කලකට පෙර කසළ බැහැර කරන ලද ඉඩම් කොටස බවයි. මෙම කොටසේ හිමිකම නගර සභාව සතු බැවින් සහ නාගරික සංවර්ධනයට අත්‍යවශ්‍ය ස්ථානයක් බැවින් වැඩි මුදලක් වියදම් වුව ද එම ඉඩමට නගර සභාවේ හිමිකාරීත්වය තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය වන බව ද සඳහන් කළේය.*

*එමෙන්ම, මාසික කුලී පදනම යටතේ ලබා දෙනු ලබන කඩකාමර දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දීම පළාත් පාලන චක්‍රලේඛයනට අනුව සිදු කරන බව පැවසීය. වාර්ෂික ගිවිසුම් මත ලබා දීමට මෙම සභාවෙන් තීරණය කළ ද, වර්ෂයක් පාසා ගිවිසුම් අත්සන් කරමින් එසේ සිදු කිරීම කාලය හා ශ්‍රමය අනවශ්‍ය ලෙස අපතේ හැරීමක් පමණක් වන බැවින් නැවතත් දීර්ඝ කාලීන පදනම යටතේ ගිවිසුම් අත්සන් කර එම කඩ කාමර මාසික කුලී පදනම යටතේ ලබා දීමට අදහස් කළ බවත් ගරු සභාපතිතුමන් සඳහන් කරන ලදී.*

**16:03 ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා සභාව අමතමින්, නගර සභා සීමාව තුළ කාණු පද්ධතිය කාණු පද්ධතියේ අඩුපාඩු තිබෙන බවත්, වැසි කාලයේ කාණු උතුරා යාම සිදුවන බැවින් කාණු තුළ එකතු වී ඇති ද්‍රව්‍ය ගොඩ දැමීම සිදු කළ යුතු බවත් සඳහන් කළේය.

රජය විසින් විදුලි ගාස්තු අත්තනෝමතිකව ඉහල දමා ඇති බව සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රීතුමන්, මධ්‍යම පන්තියේ ජනතාවට සහනදායී විදුලි බිලක් ලබා දීම සඳහා ඉල්ලීම් කිරීමට නගර සභාවේ මන්ත්‍රී කණ්ඩායම එකග වනු ඇති බවට ද විශ්වාසය පළකරන ලදී. අමාත්‍යවරුන් විසින් රට කාබාසිනියා කර ඇති බවත්, දැයට කිරුළ, මෝටර් රථ ධාවන තරග වැනි දෑ ජනතාව මත පටවා ඇති බවත්, එවැනි දෑ සීමා කර, ඒවායේ බර ද ජනතාව මත නොපටවා ඒවාට වැයවන මුදල් ප්‍රමාණය අඩු කර විදුලි ගාස්තු අඩු කිරීමට කටයුතු කළ යුතු බවත් සඳහන් කළේය.

**16:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජේ. මලික් ෂා මැතිතුමා මහා සභාව අමතමින්, ගරු නාගරික මන්ත්‍රී අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමන් විසින් විදුලි ගාස්තු අඩු කිරීමට සිදු කරන ලද යෝජනාවට අනුව ඒ සම්බන්ධව විදුලි බල ගරු අමාත්‍යතුමියට දන්වා යැවීම සුදුසු බව ප්‍රකාශ කළේය. අළුත් අවුරුද්දෙන් පසු ජනතාවට ජීවත් වීමට අසීරු තත්ත්වයක් උදා වී ඇති බැවින් මෙම විදුලි ගාස්තු ක්‍රමය ඉතා අසාධාරණ බව ද, අමාත්‍ය මණ්ඩලයේ ද වැඩි

දෙනෙක් ඒ සම්බන්ධව විරෝධය පළ කර ඇති බව ද සඳහන් කළේය. විදුලි බල ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය සාවද්‍ය ප්‍රකාශයක් සිදු කර ඇති බව හා තමන් විසින් කිසිදු දිනෙක විදුලි ගාස්තු වැඩි කිරීමට ඉල්ලීමක් නොකළ බවට විද්‍යා හා තාක්ෂණ ගරු අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමා ද පවසා ඇති බව ද, එම ඉල්ලීම කර ඇත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් පී. බී. ජයසුන්දර මහතා විසින් බව එතුමන් පැවසූ බව සඳහන් කළේය. මෙම විදුලි ගාස්තු  වැඩි වීමට ප්‍රධාන හේතුව නාස්තිය හා දූෂණය බව ද, දැයට කිරුළ, මෝටර් රථ ධාවන තරග වැනි කාර්යයන්ට අධික ලෙස විදුලි බලය පාවිච්චි කිරීමෙන් මෙම තත්ත්වය ඇති වී තිබෙන බව ද සඳහන් කළේය.

2001 වර්ෂයේ දී රනිල් වික්‍රමසිංහ මැතිතුමන් අග්‍රාමාත්‍යධූරය භාර ගන්නා අවස්ථාව වන විට දිනකට පැය 08ක් ශ්‍රී ලංකාවේ විදුලිය කැපීම සිදු කළ බව ද, විදුලි බල අමාත්‍ය ධූරය දක්ෂතම අමාත්‍යවරයකු වූ කරු ජයසූරිය මැතිතුමා හට පවරා දින 80ක් ඇතුළත එම ප්‍රශ්නය විසඳීමට එතුමන් ක්‍රියා කරන ලද බව ද සිහිපත් කළේය. එවන් නිසි කළමනාකරණයක් නොමැති කම මෙම අර්බුදකාරී තත්ත්වයන්ට හේතු වී ඇති බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය. වසර 30කින් නිම කිරීමට සැලසුම් කර තිබූ මහවැලි ව්‍යාපෘතිය වසර 06කින් අවසන් කර ලාංකික ජනතාවට විදුලිය ලබා දීමට පැවති එක්සත් ජාතික පක්ෂ රජය කටයුතු කළ බව ද තව දුරටත් සඳහන් කළේය.

දින 3 - 4 පමණ කාලයක් නගරයට ජලය සැපයීම ඇණහිට තිබූ බව සඳහන් කළ ගරු මන්ත්‍රීතුමන් ප්‍රකාශ කර සිටියේ එවන් දීර්ඝ කාලීනව ජල සැපයුම විසන්ධි කරනවා නම් ඒ සඳහා විකල්පයක් ලබා දීම කළ යුතුව තිබූ බවයි. එම දින කිහිපය තුළ ෆලීල් හාජ්ජියාර් මාවතේ ජනතාවට බවුසර මගින් ජලය සපයා දීම සම්බන්ධව ගරු සභාපතිතුමන්ට ස්තුති කරන බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය.

ලෝක කම්කරු දිනය වන මැයි 01 වන දා ශ්‍රී ලාංකික කම්කරුවන්ට ශෝක දිනයක් වන තරමට අපහසු තත්වයකට ජනතාව පත්ව ඇති බව ද එතුමන් සඳහන් කළේය.

**16:03 ගරු නාගරික එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා සභාව අමතමින්, බළන්ගොඩ නගරයේ කාණු පද්ධතියට අයත් සියළු මාර්ග හා ආශ්‍රිත කාණු නගර සභාවට අයත් නොවන අතර ඇතැම් කාණු නාගරික සංවර්ධන අධිකාරිය සහ පළාත් සභා යටතට අයත් බව ද, ඒඑ ආයතනයන්ට අයත් වන්නේ කවර මාර්ගයන්ද යන වග ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා දැන සිටිය යුතු බව ද ප්‍රකාශ කළේය. නගර සභාවට අයත් වන්නේ අතුරු මාර්ගයන් බව ද, නගර සභා මාර්ගයන්හි කාණු ඇත්තේ 10%-15% අතර පමණ වන ප්‍රමාණයක් පමණක් බව ද, ගරු මන්ත්‍රීතුමන්ලාගේ ප්‍රකාශයන් දේශපාලනික වාසි පිණිස නොවිය යුතු බවද ජනතාවට සැබෑ තත්ත්වය පැහැදිලි කළ යුතු බව ද සඳහන් කළේය.

දැයට කිරුළ වැනි වැඩසටහන් වල යම් යම් අඩුපාඩු තිබිය හැකි වුවත් ඒවා සම්පූර්ණයෙන්ම වැරදි යැයි කීම නුසුදුසු බව ද, එම ජාතික සංවර්ධන ප්‍රදර්ශනය පැවැත්වෙන ප්‍රදේශයන්හි විශාල සංවර්ධනයක් සිදු කරන බව ද ප්‍රකාශ කළේය. සෑම ආණ්ඩුවක් යටතේම මෝටර් රථ ධාවන තරගයන් ද පැවති බව ද, රටක සංවර්ධනයක් සිදුවන විට එවන් ඉසව් ද අවශ්‍ය බව ද සඳහන් කළේය. ඒවායේ ක්‍රියා පටිපාටීන් වැරදි නම් උසාවි යාමට හැකි බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

2001 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ රජය යටතේ කිසිදු සංවර්ධනයක් සිදු නොවුණු බව ප්‍රකාශ කළ ගරු මන්ත්‍රීතුමන් එම වකවානුවේ එක් අයකුට හෝ රැකියාවක් දීම සිදු නොවූ බව ද සඳහන් කළේය. එමෙන්ම කොටි සංවිධානය පෝෂණය වූ යුගයක් තිබූ බව ද සඳහන් කළේය. නමුත් වර්තමාන රජය රුපියල් කෝටි ගණන් වියදම් කර සංවර්ධනය සිදු කරන අතරතුර ලක්ෂ ගණනක් පිරිසකට රැකියා අවස්ථා ලබා දෙන බව ද සඳහන් කළේය. මහවැලි ව්‍යාපාරය ආරම්භ කරනු ලැබුවේ දිවංගත ගරු අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ කාලයේ බව ද, කොටි සංවිධානය පෝෂණය කරමින් රට විනාශ කරනු  ලැබුවේ එක්සත් ජාතික පක්ෂ රජය යටතේ බව ද සඳහන් කළේය. වර්තමානයේ විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා පවා වව්නියා හා කිළිනොච්චි

වැනි ප්‍රදේශ වල සංචාරය කරනු ලබන්නේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන් ලබා දුන් සාමය උදා කිරීම හේතුවෙන් බව ද සිහිපත් කළේය. එක්සත් ජාතික පක්ෂයට මැයි රැළි කිහිපයක් පැවැත්වීමට සිදුව තිබෙන්නේ පක්ෂය තුළ මත බේද තිබෙන බැවින් බව ද වැඩි දුරටත් සඳහන් කළේය.

රු. මිලියන 210ක වටිනා ජල ව්‍යාපෘතියක් ලැබීම බළන්ගොඩට සම්පතක් බව ද, එමගින් නගර සභා බල ප්‍රදේශයට මෙන්ම බළන්ගොඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට ද ජලය ලබා දීම කළ හැකි බව ද සඳහන් කළේය.

එමෙන්ම 2013 වර්ෂයේ අවුරුදු උත්සවය ඉතාමත් සාර්ථකව පැවති බව එතුමන් සඳහන් කළ අතර, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එයට සහභාගී නොවීම ගැන කණගාටුවට පත් වන බව සඳහන් කළේය. නගර සභාවේ අංශ ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩලය ඉතාමත් සාර්ථකව එම කටයුතු සිදු කළ බව ද, ඉතාමත් කෙටි කාලයක් ඇතුලත දානපතියන් හා වෙළඳ ව්‍යාපාරිකයන් වෙතින් විශාල මුදල් ප්‍රමාණයක් තෑගි සඳහා ලැබුණු බව ද, ඔවුන් හට ස්තුතිය පළ කරන බව ප්‍රකාශ කරන ලදී.

විපක්ෂයේ දැනට ඇති හොඳම මාතෘකාව විදුලි ගාස්තු ඉහල යාම බව ද, එම විදුලි ගාස්තු ඉහල දැමීම සියල්ලන් හට දරාගැනීමට අපහසු බව ද, අතිගරු ජනාධිපතිතුමන් ඒ සම්බන්ධව අවධානය යොමු කර සහනයක් ලබා දීම සිදු කරනු ඇති බව ද එතුමන් විශ්වාසය පළ කළේය. එමෙන්ම ස්විට්සර්ලන්තයේ ජිනීවා නගරයේ දී පැවැත්වෙන ආපදා අවදානම අවම කිරීමේ සමුළුවට ගරු සභාපතිතුමා සහ මෙම සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා හට සහභාගී වීමට අවස්ථාවක් ලැබීම සම්බන්ධව සුභ පතන බව ද, එයින් ජාත්‍යන්තර මට්ටමට පැමිණ සිටින බළන්ගොඩ නගරයට විශාල සංවර්ධන අවස්ථාවන් උදා කර ගැනීමට හැකියාව ලැබෙනු ඇති බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කළේය.

බළන්ගොඩට පාර්ලිමේන්තු නියෝජනයක් නොමැති වීමෙන් විශාල පාඩුවක් වන බව තේරුම් ගත් සබරගමුව පළාත් මාර්ග සංවර්ධන ගරු අමාත්‍ය අතුල කුමාර රාහුබද්ධ මැතිතුමන් රුපියල් එක්කෝටි පනස් ලක්ෂයක් බළන්ගොඩ ප්‍රදේශයේ මාර්ග සංවර්ධනයට ලබා දී ඇති බව ද, කහටපිටිය මාර්ගය සංවර්ධනය කිරීම සඳහා නගර සභාවේ සහ ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම පරිදි රුපියල් ලක්ෂ 45ක මුදලක් වෙන් කර තිබෙන බව ද, ඒ සම්බන්ධයෙන් එතුමන් හට ස්තුතිය පුද කරන බව ද සඳහන් කළේය. එමෙන්ම ගරු නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමන් ද ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් වෙනුවෙන් මාර්ග සංවර්ධනය පිණිස රු. ලක්ෂ 10ක් වෙන් කර තිබෙන බව ද සඳහන් කළේය.

එමෙන්ම නගරයේ විදුලි පහන් දැමීම සඳහා රු. 200,000.00 මුදල් ප්‍රතිපාදන ලබා දුන් පළාත් සභා ගරු මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමන් වෙත ද ස්තුතිය පළ කරන බව ද, පසුගිය කාලය තුළ පළාත් සභාව වෙතින් මෙම සභාවට සංවර්ධනය පිණිස මුදල් නොලැබුණු තත්ත්වයක් යටතේ සහ, විදුලි බල මණ්ඩලය සමගද නගර සභාවේ අර්බුද පැවති තත්ත්වයක් යටතේ එතුමන් විසින් සිදු කරන ලද මෙම දායකත්වය ප්‍රශංසනීය බව ද ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් දක්වන ලදී.

එමෙන්ම විශේෂ ස්තුතියක් ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමන් වෙත පිරිනමන බව ද, සමස්ත ලංකා මුස්ලිම් සංවිධානයේ නායක වශයෙන් කටයුතු කරන ආර්ථික ප්‍රවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය ෆයිසර් මුස්තෆා මැතිතුමන් වෙතින් කහටපිටිය මාර්ගයේ අලුත්වැඩියාව සඳහා රු. 1,000,000.00ක මුදල් ප්‍රතිපාදන ලබා දීම සම්බන්ධව ස්තුති කළ යුතුය.

## 17. අවසානය

**ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා**

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් සභාව අමතමින් ප්‍රකාශ කළේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉතාමත් උනන්දුවෙන් අදහස් දැක්වීම සතුටට කරුණක් බව ද, එසේ අදහස් ඉදිරිපත් වීම පාලක පක්ෂයට පහසුවක් බව ද, ජනතාවට වඩාත් හොඳ

සේවයක් සැපයීම සඳහා එය ඉතාමත් අවශ්‍ය බව ද සඳහන් කළේය. 1977 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එක්සත් ජාතික පක්ෂයට රට භාර දෙන විට රුපියලකට බොහෝ භාණ්ඩ ප්‍රමාණයක් මිල දී ගැනීමේ හැකියාවක් තිබූ බව ද, එසේ රට භාර දී නැවත 1994 දී රට භාර ගන්නා විට කැබලි වලට කැඩුණු ගැටුම් සහිත රටක් භාර ගැනීමට සිදු වූ බව ද සඳහන් කළේය.

සෑම දෙයක්ම නොමිලේ දෙන, සහනාධාර වශයෙන් ලබා දෙන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාව බව රටවල් කිහිපයක සංචාරය කිරීමෙන් තමන් ලද අත්දැකීමක් බව ද සඳහන් කළේය. පසුගිය එක්සත් ජාතික පක්ෂ රජය යටතේ ගම් උදාව වැඩසටහන යටතේ බොහෝ ප්‍රදේශ සංවර්ධනය වූ බව ද, වර්තමානයේ දැයට කිරුළ වැඩසටහන යටතේ ද ඒ ආකාරයටම බුත්තල, මහනුවර, අනුරාධපුර, අම්පාර වැනි ප්‍රදේශයන්හි සැලකිය යුතු සංවර්ධනයක් සිදු වූ බව ද, රටේ සිදුවන සංවර්ධනය ජනතාව දැන ගනු ලබන්නේ මෙබඳු විශාල ප්‍රදර්ශනයන් හරහා බව ද වැඩිදුරටත් සඳහන් කළේය. ඕනෑම දෙයකට විරුද්ධ වීම විරුද්ධ පක්ෂයේ ස්වභාවය බව ද, ඔවුන්ට ජයග්‍රහණය පිණිස එසේ කිරීමට අවශ්‍ය බව ද සඳහන් කළේය.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ හමුදාවද නොයෙකුත් විදේශ රටවල් වෙත සිය සේවය ලබා දෙන බව ද, එමගින් ද මෙරටට විශාල විදේශ විනිමයක් ලැබෙන බව ද සඳහන් කළේය. ශ්‍රී ලංකාවට සංචාරකයන් බොහෝ ප්‍රමාණයක් පැමිණෙන බව ද, තරු පහේ හෝටල් ගොඩනැගෙන්නේ එබැවින් යැයි ද, එබඳු පසුබිමක් යටතේ මෝටර් රථ ධාවන තරග ආදිය පැවැත්වීම ද කළ යුතු බව ද සඳහන් කළේය.

විදුලි ගාස්තු වැඩිවීම කාටත් ප්‍රශ්නයක් වන බව ද, එය සභාවේ වියදම් සඳහා ද බලපාන බව ද සඳහන් කළ අතර, එයට සමගාමීව දිවිනැගුම, සමෘද්ධි ආදී ව්‍යාපෘතින් හරහා බොහෝ ප්‍රතිලාභ හිමිවෙන බව ද සඳහන් කළේය. නමුත් වඩාත් වැදගත් වන්නේ ජනතාවට බියෙන් සැකයෙන් තොරව දිවයිනේ ඕනෑම තැනක ගමන් කිරීමට අවස්ථාව ලැබීම බව ද සඳහන් කළේය. ජනතාවට සියළු සහනාධාර ලබා දීමට අතිගරු ජනාධිපතිතුමන්ට ධෛර්යය හා ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් සහ සියළු දෙනාට යහපත් අනාගතයක් ප්‍රාර්ථනා කරමින් 2013 අප්‍රේල් මාසයට අයත් මහා සභා රැස්වීම අවසන් කරන බව ගරු සභාපතිතුමන් සඳහන් කළේය.

ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.